සැ. යු. - 2017.04.21 වැනි දින පළ වූ අංක 2016 දරන ගැසට් පත්‍රයේ I : II (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,017 - 2017 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2017.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 350 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මැයි මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මැයි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කළුතර දිසා අධිකරණයේ දී ය

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ කොළඹ 03, ගාලු පාරේ, අංක 293 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.

කළුතර දිසා අධිකරණයේ
නඩු අංක : 1006/එම්.බී
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 2,500,000/-
කළුතර දිසා අධිකරණයේ
ඇස්කිසි අංක : 49/2016

.......................................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. දෙල්පේ ආචාරිගේ චාමික ප්‍රසාද්
   අංක 447, ගාලු පාර,
   නල්ලුරුව,
   පානදුර.

   *සහ*

   නිමල් ඇන්ටික්ස්,
   අංක 3/14, ස්වර්ණ පෙදෙස,
   නාවල.

   *නව ලිපිනය :*

   සී. එස්. ටෙක්නොලොජීස්
   අංක 337, ගාලු පාර,
   කොළඹ 03.

2. දෙල්පේ ආචාරිගේ නිමල්සිරි,
   අංක 195, ගාලු පාර,
   පයාගල උතුර,
   පයාගල.

.................................*විත්තිකරුවන්.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසියට අනුව පහත උපලේඛනයේ සඳහන් දේපල 2016.10.18 වැනි දින මා විසින් තහනම් කිරීමෙන් පසු ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවීම පැහැර හැර ඇති රු. 1,903,606/18ක මුදල (ගෙවන ලද මුදල අඩු කිරීමෙන් පසුව) සහ එකී මුදල මත 2008 අගෝස්තු මස 27 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වසරකට සියයට විසිදෙක (22%) බැගින් වූ වැඩිපුර පොලියක් ද, නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා මා විසින් 2016.10.18 වැනි දින තහනමට ගෙන ඇති විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල වර්ෂ 2017ක් වූ ජුනි මස 16 වැනි දින ප. ව. 2.30 ට විත්තිකරුගේ දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසි පහක (25%) මුදලක් ද පිස්කල් ගාස්තු, රජයට අය විය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවේලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් භාර ගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑපහක (75%) ඉතිරි මුදල දින 30ක් ඇතුළත කළුතර දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපළ පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය :* කොළඹ සිට ගාලු පාරේ කටුකුරුන්ද මන්සංන්ධියේ සිට කිලෝමීටර් 2ක් ඉදිරියට ගිය පසු ගාලු පාරට මායිම්ව මහා පයියාගල අංක 212 දරන මෙම දේපළට ලඟා විය හැක.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ දකුණු තොටමුනේ කළුතර පයියාගල බැද්දේහි මහා පයියාගල පිහිටි ග්‍රෙගරි කොටේජ් හෙවත් ලියන්නා වත්ත, කරන්දගහවත්ත, සහ කුඩා හෙරයා වත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එන්. ඩී. එස්. වීරක්කොඩි විසින් 1998 මැයි මස 07 වැනි දින පිඹුරුපත් අංක 3901 යටතේ මැන බෙදා වෙන්කර සකස් කරන ලද කොටසට උතුරට : මෙම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : කෙවිටියාගල ලියනගේ යන අයවළුන්ට අයත් ඉඩමෙන් ද, දකුණට : මෙම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයෙන් ද, මායිම් වූ පර්චස් විසිහයකින් (අක්. 0, රූ. 0, පර්. 26) සමන්විත ඉඩමේ පිහිටි සියලු දේත් සමඟ වේ.

ඉහත ඉඩම් කොටස පහත විස්තර වන ඉඩමෙන් නැවත මනින ලද්දකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ දකුණු තොටමුනේ කළුතර පයියාගල බැද්දේ හි මහා පයියාගල පිහිටි ග්‍රෙගරි කොටේජ් *හෙවත්* ලියන්නා වත්ත, කරන්දගහ වත්ත සහ කුඩා හෙරයා වත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එල්. ඒ. එච්. රාජකාරියර් විසින් 1959 අගෝස්තු මස 25 වැනි දින පිඹුරුපත් අංක 860 යටතේ මැන බෙදා වෙන්කර සකස් කරන ලද කැබලි අංක 03 දරන කොටසට, උතුරට : පිඹුරුපත් අංක 860 හි සඳහන් කැබලි අංක 04න් ද, නැගෙනහිරට : කෙවිටියාගල ලියනගේ යන අයවළුන්ට අයත් ඉඩමෙන් ද, දකුණට : කැබලි අංක 02න් ද, බස්නාහිරට : එකී පිඹුරට අනුව ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයෙන් ද, මායිම් වූ පර්චස් විසිහයයි දශම අටකින් (අක්. 0, රූ. 0, පර්. 26.8) සමන්විත ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක H 261/140හි ලියාපදිංචි කර ඇත.

සී. එන්. වීරක්කොඩි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කළුතර.

වර්ෂ 2017 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින දී ය.

04-729

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.